# සියක්‍රීට්

## ඉදිකිරීම් රසායනික ද්‍රව්‍ය හා ආලේපන

Manufactured by an
ISO 9001 2015
Certified Company

# ටයිල් ඇඩෙසිව්

## විස්තරය

සියක්‍රීට් ටයිල් ඇඩෙසිව් යනු ISO 9001:2015 තත්ත්ව කළමණාකරණ ක්‍රියාපටිපාටිය අනුව ජාත්‍යන්තරව පිළිගත් අමුද්‍රව්‍ය හා ප්‍රමිතීන්ට අනුකූලව වැඩි දියුණු කළ පොලිමර් භාවිතා කර නිෂ්පාදනය කර ඇති විවිධ වර්ගයේ ටයිල් සවි කිරීමට (නිෂ්පාදන වර්ගීකරණය අනුව ECO/Plus/Premium) භාවිතා කළ හැකි අනර්ඝ නිෂ්පාදනයකි.




## විශේෂාංග

| | TILE ADHESIVE ECO (VERY ECONOMICAL & HIGH WORKABILITY) | TILE ADHESIVE PLUS (ANTI SLIP PROPERTIES) | TILE ADHESIVE PREMIUM (TILE ON TILE APPLICATION) |
|---|---|---|---|
| ඉක්මන් හා පහසු භාවිතය | ■ | ■ | ■ |
| නවීනකරණය කළ පොලිමර් භාවිතා කර ඇත | ■ | ■ | ■ |
| 2' x 2' ටයිල් සවි කිරීම සඳහා සුදුසු වේ | ■ | ■ | ■ |
| සාමාන්‍ය සිමෙන්ති වලට වඩා බන්ධන ශක්තියක් ඇත | ■ | ■ | ■ |
| ඉතා ලාභදායි හා ඉහළ කාර්යක්ෂමතාවයකින් යුක්ත වේ | ■ | ■ | ■ |
| බිත්ති හා පොළව සඳහා භාවිතා කළ හැක | ■ | ■ | ■ |
| ඉහළ බන්ධන ශක්තියකින් යුක්ත වේ | ■ | ■ | ■ |
| පෝසිලේන් හා සෙරමික් ටයිල් සඳහා සුදුසු වේ | ■ | ■ | ■ |
| බිත්ති මත ටයිල් ඇල්ලීමේදී ටයිල් ලිස්සා නොයයි | | ■ | ■ |
| ඕනෑම රළු ක්ෂේත්‍රයක ටයිල් සවි කිරීම සඳහා යෝග්‍ය වේ | | ■ | ■ |
| ග්‍රැනයිට් ටයිල් සඳහා සුදුසුයි | | ■ | ■ |
| අභ්‍යන්තර හා බාහිර ක්ෂේත්‍ර වල භාවිතය සඳහා සුදුසුයි | | ■ | ■ |
| ටයිල් ඇල්ලීමෙන් පසු මතුපිට තෙතමයට ඔරොත්තු දෙයි | | ■ | ■ |
| 2'x2' වඩා විශාල ටයිල් සඳහා යෝග්‍ය වේ | | ■ | ■ |
| පරණ ටයිල් මත අලුත් ටයිල් සවිකිරීමට ඉතා යෝග්‍ය වේ | | | ■ |
| ඕනෑම ප්‍රමාණයේ ටයිල් සඳහා භාවිතා කළ හැක | | | ■ |
| ජලය උරා නොගනී | | | ■ |

උසස් නිමාවකට සියුම් අංශු භාවිතා කොට ඇත

සාමාන්‍ය සිමෙන්ති වලට වඩා ශක්තිමත් බන්ධනය

අභ්‍යන්තර හා බාහිර ක්ෂේත්‍ර වල භාවිතය සඳහා සුදුසුයි

හොඳ බන්ධන ශක්තියකින් යුක්තයි

ඉහළ පොලිමර් ප්‍රතිශතයක් භාවිතා කර ඇත

CEYAKRETE
construction chemicals & coatings

# ටයිල් ඇඩෙසිව්

## විශේෂණයන්

**ආවරණය:** වර්ග අඩි 40 - 50
(ක්ෂේත්‍රයේ මතුපිට ස්වභාවය මත වෙනස් වේ)

**ඝණකම:** මිලි මීටර් 3 - 5

**අවශ්‍ය ජල ප්‍රමාණය:** ලීටර 4 - 5

**ඇසුරුමේ ප්‍රමාණය:** කිලෝ ග්‍රෑම් 25

**වර්ණය:** අළු

**වියලීමේ කාලය:** ටයිල් සවි කර පැය 24 කට පසු ටයිල් මත සෙමින් ඇවිදිය හැක

**මිශ්‍රණය තබා ගත හැකි කාලය:** මිශ්‍ර කළ වේලාවේ සිට පැය 2 ක කාලයක්

**කල් තබා ගත හැකි කාලය:** සිසිල් වියළි ස්ථානයක ඉහළ තලයක තැබීමෙන් මාස 6 ක් දක්වා කල් තබා ගත හැක

**සහතික:** ISO 9001:2015 තත්ත්ව කළමනාකරණ සහතිකය සහ සහතික කළ පරීක්ෂණ වාර්තා

## භාවිතයට උපදෙස්

### ක්ෂේත්‍රය මතුපිට සකස්කිරීම

වැඩ ආරම්භ කිරීමට පෙර ටයිල් සවි කිරීමට අවශ්‍ය ක්ෂේත්‍රයේ සුමට බව තහවුරු කරගන්න.
අපිරිසිදු ග්‍රීස්, තෙල්, ඉටි වැනි අපද්‍රව්‍ය ඉවත් කර, ක්ෂේත්‍රය මතුපිට සම්පූර්ණයෙන් වියළීමට හරින්න.

### මිශ්‍ර කිරීම හා ආලේප කිරීම

සියක්‍රීට් ටයිල් ඇඩෙසිව් පිරිසිදු ජලය සමග මිශ්‍ර කරන්න. සියක්‍රීට් ටයිල් ඇඩෙසිව් කි.ග්‍රෑ. 25 කට ආසන්න වශයෙන් ජලය ලීටර් 4 - 5 ක් භාවිතා කරන්න. සිනිඳු මිශ්‍රණයක් ඇති වන තෙක් මිශ්‍රණ යන්ත්‍රයක් භාවිතයෙන් හොඳින් මිශ්‍ර කර ගන්න.

- මිශ්‍රණය ආලේප කිරීමට පෙර ක්ෂේත්‍රය තෙත් කරගන්න.
- ටයිල් ඇඩෙසිව් මිශ්‍රණය ටයිල් සවි කරන ක්ෂේත්‍රය මතුපිට (පොළව/බිත්තිය) 3 - 5 mm ක ඝනකමට ආලේප කරගන්න.
- ටයිල් අතර හිඩැස් ඇති නොවන පරිදි ටයිල් අතුරා අවශ්‍ය නම් රබර් මිටියක් ආධාරයෙන් හොඳින් තද කර ගන්න.
- ආලේප කර ගත් මිශ්‍රණය මත මිනිත්තු 10 ක් ඇතුලත ටයිල් ඇතිරීමට වග බලා ගන්න. ටයිල් ඇලවීමට පෙර මිශ්‍රණය වියලීමට ඉඩ නොහරින්න.

ටයිල් සවි කර අවම වශයෙන් පැය 12 කට පසු ග්‍රවුට් කිරීම කළ යුතුය.

**සෞඛ්‍ය හා ආරක්ෂාව:** මෙම නිෂ්පාදනය භාවිතයේ දී ආරක්ෂිත අත් වැසුම් හා මුඛ ආවරණ භාවිතා කරන්න. සමේ තැවරුණහොත් පිරිසිදු ජලයෙන් සෝදා හරින්න. සමේ ආසාත්මික තාවක් ඇති වුවහොත් වෛද්‍ය උපදෙස් ලබා ගන්න.

**කොන්දේසි:** මෙම නිෂ්පාදනය භාවිතය නිෂ්පාදකයාගේ පාලනයෙන් තොර වන අතර දෝෂ සහිත ආදේශක භාවිතයෙන් ඇතිවන විෂමතා සඳහා නව භාණ්ඩ ලබා දෙනු නොලැබේ. එමෙන්ම එවැනි අවස්ථාවක සිදු විය හැකි අලාභානි සඳහා නිෂ්පාදකයා වග කියනු නොලැබේ.

Member of
CRI Group
ESTB 1950

Subsidiary of Ceylon Rubber Industries Ltd.

Ceyalac (Pvt) Ltd.
#10 (1st Floor), School Lane,
Colombo 03, Sri Lanka.
+94 11 7222252
+94 11 2507770
info@ceyalac.com
www.ceyalac.com

**Sales Hotline: 773 833 929**